# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1320 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 14/08/2024 පැය 1330

## මාධ්‍ය නිවේදනය

### කරාතේ තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

යුනිවර්සල් ෂෝටෝකාන් කරාතේ දෝ සංගමය විසින් සංවිධානය කරන ලද **“2024 වික්ටරි විවෘත කරාතේ ශූරතාවලිය”** 2024.08.11 වන දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත් වූ අතර තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා පොලීසිය, ත්‍රිවිධ හමුදාව ඇතුළු කරාතේ සංගම් 38ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1390ක් සහභාගි විය.

එහිදී තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා පොලීසිය නියෝජනය කරමින් ක්‍රීඩකයින් 17 දෙනෙකු වයස 21ට වැඩි ජ්‍යෙෂ්ඨ අංශය යටතේ තරඟ වැදුණු අතර කේවල කාතා, කේවල කුමිතේ, සහ කණ්ඩායම් කාතා යන ඉසව්වන්ගෙන් රන් පදක්කම් 13ක්, රිදී පදක්කම් 03ක්ද, ලෝකඩ පදක්කම් 04ක් සමඟ මුළු පදක්කම් 20ක් දිනා ගැනීමට සමත් වී ඇත.

පොලිස් කරාතේ සංගමයේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ඒ.ජී.ජේ. චන්ද්‍රකුමාර මහතා කටයුතු කරනු ලබන අතර ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පී.ජී.එස්. ගුණතිලක මහතා ද, කළමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක ඩබ්.පී. චතුරංග මහතා සහ පුහුණුකරු ලෙස එම්.එන්.ජුරම්පති මහතා කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**



**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**